**ශීර්ෂය 6 - රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 6 - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 20 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 422.64 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 210.62ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 212.02 ක් හෙවත් සියයට 50 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදන | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 141.54 | 140.15 | 1.39 | 0.98 |
| මූලධන | 281.10 | 70.47 | 210.63 | 74.93 |
| එකතුව | 422.64 | 210.62 | 212.02 | 50.17 |

## 2.2 අත්තිකාරම් ගිණුම

### රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

කොමිෂන් සභාවට අදාළ විෂය අංක 00601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 7.50 | 7.50 | 3.74 | 5.18 | 33.00 | 21.21 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

කොමිෂන් සභාව යටතේ පොදු තැන්පත් ගිණුම් 03 කට අදාළ ශේෂ එකතුව රු.මිලියන 6.85 ක් විය. විස්තර පහත දැක්වේ.

| පොදු තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0081/000 | 0.008 |
| 6000/0000/00/0013/0051/000 | 0.008 |
| 6000/0000/00/0016/0068/000 | 6.835 |
| එකතුව | **6.851** |

## 2.4 විගණන නිරීක්ෂණය

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 00601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී, වසර 14 කට පෙර සේවය හැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.32,320 ක ආපදා ණය මුදල 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කොමිෂන් සභාවේ කාර්යාලය අපොහොසත් වී තිබුණි.

### 3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 3.2.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

#### 3.2.2 විගණන හා කළමනාකරණ කමිටුව

2009 ජුනි 09 දිනැති DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු වුවත්, 2015 වර්ෂය සඳහා කමිටුවේ රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

### 3.3 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | වාහනයක් සම්බන්ධයෙන් මාස 6 කට වරක් ඉන්ධන දැවීම් පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) | **කළමනාකරණ විගණන චක්‍රලේඛය** | |
| | 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) | කොමිෂන් සභාව සතු වාහන සඳහා පිරිවැය වාර්තා පිළියෙල කර නොතිබුණි. |

**3.4** **කාර්යසාධනය**

**-----------------**

2015 වර්ෂයේදී විනය කටයුතු 370 ක් විසදා තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දින වන විට විසදිය යුතු විනය කටයුතු සංඛ්‍යාව 385 ක් විය. නව බඳවා ගැනීමේ පටිපාටි 181 න් 96 ක් අඩුපාඩු සකස් කිරීම සඳහා අමාත්‍යාංශ වෙත ආපසු යවා තිබු අතර, 22 ක කටයුතු සිදු කෙරෙමින් පැවතුණි. මේ අනුව නව බඳවා ගැනීමේ පටිපාටි 118 ක් අනුමත කිරීමට නොහැකි වී තිබුණි. නව සේවා ව්‍යවස්ථා සැකසීම් 9 කින් 4 ක්ද, ස්ථාන මාරු පටිපාටි 8 කින් 5 ක්ද අනුමත කිරීමට නොහැකි වී තිබුණි. කොමිෂන් සභාවේ අභියාචනා අංශයට ලද අභියාචනා 2272 න් 1451 ක් විසදා තිබුණු අතර 821 කටයුතු අවසන් වී නොතිබුණි.

**3.5** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සංඛ්‍යාව** | **තථ්‍ය සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 40 | 35 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 06 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 97 | 96 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 48 | 34 | 14 |
| | **එකතුව** | **192** | **171** | **21** |